# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 අගෝස්තු මස 17 වන දින

## II වන කොටස

## අතිරේකය

(2018.08.20 දින නිකුත් කරන ලදී)

# ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන)

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය* : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීම මගින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ විදුලිබල සැපයුම අවශ්‍ය තැනැත්තකු විසින් තැන්පත් කළ ඇප මුදල් මත පොලිය ගෙවීමේ වගකීම බෙදාහැරීමේ බලපත්‍රලාභියාගෙන් ඉවත් කිරීම වේ.

*3 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ (4), (6) සහ (8) වන උපවගන්ති සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) (4) වන උපවගන්තියේ අතුරු විධානයේ (ආ) ඡේදය යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම්, සම්ප්‍රදායික නොවන බලශක්ති ප්‍රභව සිතියම් නොමැති වූ ද, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්මත අයක්‍රම අනුව ක්‍රියාත්මක වන්නා වූ ද, සම්ප්‍රදායික නොවන නැවත බලගැන්විය හැකි බලශක්ති ප්‍රභවයක් හරහා විදුලි බලය උත්පාදනය කරන්නා වූ, නව උත්පාදන පිරියතවලට හෝ පවත්නා උත්පාදන පිරියතවලට අදාළ වන පරිදි ව්‍යාප්ත කිරීම;

(ආ) (6) වන උපවගන්තිය ප්‍රතියෝජනය කිරීමෙන් ඒ උපවගන්තියට ආනුෂංගික සංශෝධන සිදුකිරීම; සහ

(ඇ) "සම්මත විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම" යන යෙදුමේ අර්ථ නිරූපණය ප්‍රතියෝජනය කිරීම සහ "සම්මත අයක්‍රම" යන යෙදුමේ අර්ථ නිරූපණය ඇතුළත් කිරීම,

වේ.

එල්.ඩී.— ඕ. 19/2014

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2018 අංක දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 වන වගන්තිය, එහි (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. 2009 අංක 20 දරන පනතේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (4) වන උපවගන්තියේ -

(අ) (අ) ඡේදයේ අතුරු විධානයේ "සැලසුමට අනුකූලව;" යන වචන වෙනුවට "සැලසුමට අනුකූලව; හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් -

"(ආ) සම්ප්‍රදායික නොවන නැවත බලගැන්විය හැකි බලශක්ති ප්‍රභව සිතියම් නොමැතිවීම හේතුවෙන් විවෘත ලංසු තැබීමේ ක්‍රියාවලියක් සිදුකිරීමට නොහැකි වන, සම්ප්‍රදායික නොවන නැවත බලගැන්විය හැකි බලශක්ති ප්‍රභවයන් මාර්ගයෙන් විදුලිබලය උත්පාදනය කිරීම සඳහා 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 18 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින්, නිකුත් කරන ලද, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්මත අයකුම මත ක්‍රියාත්මක කරනු ලබන සහ සම්මත විදුලි බලය මිල දී ගැනීමේ ගිවිසුමක් මගින් පාලනය වන අවසරයක් මත; හෝ";

(2) එහි (6) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

“(6) ටෙන්ඩරයක් ඉදිරිපත් කිරීමෙන් නිදහස් කිරීමක් යම් තැනැත්තකු වෙත-

(අ) (4) වන උපවගන්තියේ අතුරු විධානයේ (ආ) ඡේදය යටතේ ප්‍රදානය කරනු ලැබූව ද එය නොතකා, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ තාක්ෂණික හා පිරිමැසුම්දායී පරාමිතීන්ට අනුකූලව ඒ තැනැත්තා අලුත් උත්පාදන පිරියතක් වැඩිදියුණු කිරීමට හෝ පවතින උත්පාදන පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීමට හැකියාවක් ඇති තැනැත්තකු බවට සහ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්මත අයකුම මත,සම්මත විදුලි බලය මිල දී ගැනීමේ ගිවිසුමෙහි නියම සහ කොන්දේසිවලට අනුකූලව, සම්ප්‍රදායික නොවන නැවත බලගැන්විය හැකි බලශක්ති ප්‍රභවයන් භාවිත කරමින් නිපදවන ලද විදුලිබල ශක්තිය හෝ විදුලිය උත්පාදන ධාරිතාව අලෙවි කිරීමට හැකියාවක් ඇති තැනැත්තකු බවට සෑහීමට පත්විය යුතු ය ; හෝ

(ආ) (4) වන උපවගන්තියේ අතුරු විධානයේ (අ) හෝ (ඇ) ඡේද යටතේ ප්‍රදානය කරනු ලැබූව ද එය නොතකා, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ තාක්ෂණික හා පිරිමැසුම්දායී පරාමිතීන්ට අනුකූලව ඒ තැනැත්තා අලුත් උත්පාදන පිරියතක් වැඩි දියුණු කිරීමට හෝ පවතින උත්පාදන පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීමට හැකියාවක් ඇති සහ අඩුම පිරිවැයකට විදුලිබල ශක්තිය හෝ විදුලිය උත්පාදන ධාරිතාව අලෙවි කිරීමට හැකියාවක් ඇති තැනැත්තකු බවට සෑහීමට පත්වීම පිණිස එම අදාළ තැනැත්තා සමඟ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා සාකච්ඡා කළයුතු අතර, විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුමේ කෙටුම්පත සමඟ ඒ මිලදී ගැනීමේ නියමයන් හා කොන්දේසි විස්තර කරමින්

කොමිෂන් සභාවේ නිර්දේශ ලබාගැනීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය සඳහා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය.";

(3) එහි (8) වන උපවගන්තියේ -

(අ) "සම්මත විදුලි බලය මිල දී ගැනීමේ ගිවිසුම" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

"සම්මත විදුලි බලය මිල දී ගැනීමේ ගිවිසුම" යන්නෙන්, සම්ප්‍රදායික නොවන නැවත බලගැන්විය හැකි බලශක්ති ප්‍රභව සිතියම් නොමැති වීම හේතුවෙන් විවෘත ලංසු තැබීමේ ක්‍රියාවලියක් සිදුකිරීමට නොහැකි සම්ප්‍රදායික නොවන නැවත බලගැන්විය හැකි බලශක්ති ප්‍රභවයන් භාවිත කරමින්, මෙගාවොට් 10 ක් හෝ ඊට අඩු ධාරිතාවයකින් යුත් විදුලිබල ශක්තිය උත්පාදනය කිරීමට 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 18 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් නිකුත් කළ අවසර පත්‍රයක් මගින් බලය ලබාදෙන ලද, විදුලිබල පිරියතකින් විදුලිබල ශක්තිය මිලදී ගැනීම සඳහා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් ඇතුළත් වූ ගිවිසුමක් අදහස් වේ;"; සහ

(ආ) "සම්මත විදුලි බලය මිල දී ගැනීමේ ගිවිසුම" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය එකතු කිරීමෙන්:-

""සම්මත අයකුම" යන්නෙන්, සම්ප්‍රදායික නොවන නැවත බලගැන්විය හැකි බලශක්ති ප්‍රභව සිතියම් නොමැතිවීම හේතුවෙන් විවෘත ලංසු තැබීමේ ක්‍රියාවලියක් සිදුකිරීමට නොහැකි වන, සම්ප්‍රදායික නොවන නැවත බලගැන්විය හැකි බලශක්ති ප්‍රභවයන් මාර්ගයෙන් මෙගාවොට්

10 ක් හෝ ඊට අඩු ධාරිතාවයකින් යුත් විදුලිබලය උත්පාදනය කිරීමට 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 18 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් නිකුත් කළ අවසර පත්‍රයක් මගින් බලය දෙන ලද විදුලිබල පිරියතකින්, විදුලිබල ශක්තිය මිල දී ගැනීමට සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතු වන සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ මුල්‍ය ශක්‍යතාව සහ පාරිභෝගිකයාට දැරිය හැකි බව සැලකිල්ලට ගනිමින් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මිල නිශ්චය කිරීමේ කමිටුව මගින් නිර්දේශ කර අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ මිල අදහස් වේ.”.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.